# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,825 - 2013 අගෝස්තු මස 23 වැනි සිකුරාදා - 2013.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | 742 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 742 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 745 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 748 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 සැප්තැම්බර් මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අගෝස්තු මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

741– B 080759—2,100 (2013/08)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2013 අංක 273

MOD/DEF/2/01/ARF/RET/337.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 ජනවාරි මස 14 වන දින සිට තාවකාලික මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් ගුස්තිඤ්ඤ වඩු හිමත් කුලදේව ද සිල්වා ගැහේබ (නි/62032)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 ජනවාරි මස 15 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ගුස්තිඤ්ඤ වඩු හිමත් කුලදේව ද සිල්වා ගැහේබ (නි/62032)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

08-677

---

2013 අංක 274

MOD/DEF/2/01/ARF/COR/339.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අනිවාර්ය විශ්‍රාම ගැන්වීමක්

පහත නම් සඳහන් නිලධාරි 2013 අප්‍රේල් මස 06 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් අනිවාර්ය විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතාන් විල්ආරච්චිගේ දොන් නිරෝෂාන් ප්‍රියංග විජේසිංහ ගුණතිලක ශ්‍රීලංසිරෙ (නි/65819)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

08-675

---

2013 අංක 275

MOD/DEF/2/01/ARF/COR/340.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අනිවාර්ය විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරි 2013 මැයි මස 26 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් අනිවාර්ය විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතාන් රත්නායක මුදියන්සේලාගේ සුරංජිව වීරනාත් රත්නායක ශ්‍රීලංසිරෙ (නි/65811)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

08-676

---

MOD/DEF/2/01/ARF/CW/338.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් නියම කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් පහත නම සඳහන් නිලධාරි 2012 දෙසැම්බර් මස 07 වන දින සිට අධිකාරියෙන් ඉවත් කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් නියම කර ඇත.

දෙවන ලුතිතන් මැහැරඹ වල්පිට ගමගේ විරාජිත ශ්‍රීලකාභ (නි/63308)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

08-678

2013 අංක 276

D/AF/706.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

**අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

2010 ජුනි මස 30 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

විං කමාන්ඩර් හික්කඩුව ගලප්පත්තිගේ නලින් ප්‍රියන්ත ගලප්පත්ති (01788) - පරිපාලන/රෙජිමේන්තු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 ජූලි මස 08 වැනි දින,
කොළඹ දී ය.

08-700

---

# වෙනත් පත්කිරීම් ආදිය

2013 අංක 277

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පත් කිරීම්**

1. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ආර්. එම්. ජී. සේනාරත්න මහතා 2012.07.16 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන වැඩ බලන නියෝජ්‍ය කොමසාරිස් වශයෙන්
2. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ කේ. සුලෝජිනි මහත්මිය 2012.07.23 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වශයෙන්
3. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ කේ. එම්. එල්. සී. කුලරත්න මහත්මිය 2012.08.29 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන වැඩ බලන නියෝජ්‍ය කොමසාරිස් වශයෙන්
4. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ආර්. පී. කලුපහන මහතා 2012.09.12 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වශයෙන්,
5. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ බී. එම්. සී. එච්. කුමාරිහාමි මෙනවිය 2012.09.24 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වශයෙන්
6. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ එන්. පී. ගමගේ මෙනවිය 2012.09.24 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වශයෙන්
7. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ එම්. සී. මලවිආරච්චි මෙනවිය 2012.09.24 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වශයෙන්
8. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ එම්. ඊ. වීරසිංහ මෙනවිය 2012.09.24 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වශයෙන්,
9. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ වයි. අයි. ඩී. ගුණවර්ධන මෙනවිය 2012.09.24 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වශයෙන්.
10. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ පී. ඒ. මධුශංක මහතා 2012.09.24 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වශයෙන්
11. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ එම්. එල්. එන්. සඳමාලි මහත්මිය 2012.09.24 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වශයෙන්
12. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ඩබ්. එම්. ඩී. කේ. වික්‍රමසිංහ මෙනවිය 2012.09.24 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වශයෙන්,
13. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ඒ. එම්. ජී. සී. ඒ. මැණිකේ මෙනවිය 2012.10.01 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වශයෙන්
14. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ජේ. ඩී. එන්. එස්. ජයකොඩි මහතා 2012.10.01 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වශයෙන්
15. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ආර්. එම්. එන්. විජයතුංග මහතා 2012.10.01 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වශයෙන්,

16. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ඊ. යූ. ඩබ්. ඩී. බී. කේ. ඇහැලේපොල මහතා 2013.01.04 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වශයෙන්,
17. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ජේ. ඒ. එස්. පී. ජයසිංහ මහතා 2013.01.16 දින සිට නැවත නියමයක් කරන තුරු මැතිවරණ දෙපාර්තමේන්තුවේ මැතිවරණ කොමසාරිස්වරයකු වශයෙන්,
18. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ එම්. එම්. ආර්. රත්නායක මෙනවිය 2012.01.02 දින සිට නැවත නියමයක් කරන තුරු ප්‍රවාහන අමාත්‍යාංශයේ සහකාර ලේකම් (ඉඩම්) වශයෙන්,
19. ශ්‍රී. ලං. ප. සේ III පන්තියේ යූ. එල්. එම්. ජේ. ජයතිලක මහත්මිය 2012.09.24 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යාංශයේ සහකාර ලේකම් (පාලන) වශයෙන්,
20. ශ්‍රී.ලං.ප. සේ. III පන්තියේ සී. ඩී. සී. ජීවනී මහත්මිය 2012.09.24 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යාංශයේ සහකාර ලේකම් (ආයතන) වශයෙන්,
21. ශ්‍රී. ලං. ප. සේ I පන්තියේ ඒ. එම්. කේ. කේ. අත්තනායක මහත්මිය 2013.03.14 දින සිට නැවත නියමයක් කරන තුරු අග්‍රාමාත්‍ය කර්යාලයේ සහකාර ලේකම් වශයෙන්,
22. ශ්‍රී ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියේ ශාන්ත බණ්ඩාර මහතා 2013.01.01 දින සිට නැවත නියමයක් කරන තුරු ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ග්‍රාමීය සංවර්ධන) වශයෙන්,
23. ශ්‍රී. ලං. ප. සේ විශේෂ ශ්‍රේණියේ එම්. එම්. පී. කේ. මායාදුන්නෙ මහතා 2013.01.01 දින සිට නැවත නියමයක් කරන තුරු ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ආයෝජන) වශයෙන්,
24. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ආර්. කේ. සමන් අනුර මහතා 2013.03.01 දින සිට නැවත නියමයක් කරන තුරු රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ වශයෙන්,
25. ශ්‍රී. ලං. ප. සේ. I පන්තියේ එම්. කේ. කේ. රසිකා අබේදීර මහත්මිය 2013.02.26 දින සිට නැවත නියමයක් කරන තුරු සමාජ සේවා අමාත්‍යාංශයේ ජාතික උපදේශන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ වශයෙන්,
26. ශ්‍රී. ලං. ප. සේ විශේෂ ශ්‍රේණියේ එස්. සේනානායක මහතා 2013.04.02 දින සිට නැවත නියමයක් කරන තුරු සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන්,
27. ශ්‍රී. ලං. ප. සේ. විශේෂ ශ්‍රේණියේ ආචාර්ය අයි. එච්. කේ. මහානාම මහතා 2013.04.04 දින සිට නැවත නියමයක් කරන තුරු අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම් වශයෙන්,
28. ශ්‍රී. ලං. ප. සේ. I පන්තියේ චම්පා කුමුදිනී විජේමාන්න මහත්මිය 2013.03.22 දින සිට නැවත නියමයක් කරන තුරු ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ඉඩම්) වශයෙන්
29. ශ්‍රී. ලං. ප. සේ. I පන්තියේ ඩබ්. එම්. ටී. ඩී. වික්‍රමසිංහ මහත්මිය 2013.03.19 දින සිට නැවත නියමයක් කරන තුරු ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සංවර්ධන) වශයෙන්,
30. ශ්‍රී. ලං. ප. සේ. විශේෂ ශ්‍රේණියේ ඒ. පී. ජී. කිත්සිරි මහතා 2013.01.01 දින සිට නැවත නියමයක් කරන තුරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) වශයෙන්,
31. ශ්‍රී. ලං. ප. සේ. විශේෂ ශ්‍රේණියේ ජේ. එස්. ඩී. එම්. ඒ. අබේවර්ධන මහතා 2013.04.16 දින සිට නැවත නියමයක් කරන තුරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) වශයෙන්,
32. ශ්‍රී. ලං. ප. සේ. II පන්තියේ ස්වර්ණා ද සිල්වා මහත්මිය 2013.05.03 දින සිට නැවත නියමයක් කරන තුරු රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මොණරාගල ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ වශයෙන්,
33. ශ්‍රී. ලං. ප. සේ. I පන්තියේ එල්. ඩී. සී. මහානාම මහතා 2013.05.02 දින සිට නැවත නියමයක් කරන තුරු අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන්,
34. ශ්‍රී. ලං. ප. සේ III පන්තියේ එන්. කේ. ටී. සජීවනී මහත්මිය 2013.05.02 දින සිට නැවත නියමයක් කරන තුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්,
35. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ඩී. එම්. එන්. දිසානායක මහතා 2013.06.06 දින සිට නැවත නියමයක් කරන තුරු පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් වශයෙන්,
36. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ඩී. ඒ. සිරිවීර මිය 2013.05.07 දින සිට නැවත නියමයක් කරන තුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්,
37. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ එස්. එම්. ජී. කේ. සමරකෝන් මිය 2013.01.24 දින සිට නැවත නියමයක් කරන තුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්,
38. ශ්‍රී. ලං. ප. සේ. විශේෂ ශ්‍රේණියේ කේ. ඒ. කේ. ආර්. ධර්මපාල මහතා 2013.06.10 දින සිට නැවත නියමයක් කරන තුරු අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන්,
39. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ පී. උබයසිරි මහත්මිය 2012.01.16 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස්වරයකු වශයෙන්,
40. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ එස්. ඒ. ඊ. ඩබ්. කුලරත්න මහත්මිය 2011.11.02 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස්වරයකු වශයෙන්,
41. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ඩබ්ලිව්. සී. එස්. කේ. රත්නායක මහතා 2011.11.02 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස්වරයකු වශයෙන්,
42. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ආර්. එම්. එන්. සී. හේමකුමාර මහතා 2012.09.28 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස්වරයෙකු වශයෙන්,
43. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ කේ. ජී. ඒ. කේ. පලුගස්වැව මහතා 2012.09.28 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස්වරයෙකු වශයෙන්,
44. ශ්‍රී.ලං.ප. සේ. III පන්තියේ බී. ඩී. එස්. ටී. ගුණරත්න මහත්මිය 2012.09.28 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස්වරයකු වශයෙන්,
45. ශ්‍රී.ලං.ප.සේ. III පන්තියේ කේ. පී. ටී. ප්‍රේමදාස මෙනවිය 2012.09.28 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස්වරයකු වශයෙන්,
46. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ එන්. එම්. වෙත්තසිංහ මහත්මිය 2012.09.28 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස්වරයකු වශයෙන්,
47. ශ්‍රී.ලං.ප.සේ III පන්තියේ එන්. එන්. සුදුසිංහ මහත්මිය 2012.09.28 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස්වරයකු වශයෙන්,
48. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ එල්. පී. සී. සුබෝධිනී මහත්මිය 2012.09.28 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස්වරයකු වශයෙන්,
49. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ සී. පී. සමරසිංහ මහතා 2012.11.22 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස්වරයකු වශයෙන්,

50. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ජී. අරුණන් මහතා 2012.11.22 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස්වරයකු වශයෙන්
51. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ඩබ්ලිව්. ඩී. සේපාලිකා මහත්මිය 2012.11.22 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස්වරියක වශයෙන්,
52. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ඩබ්. කේ. චතුරංගි මෙනවිය 2012.11.22 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස්වරයකු වශයෙන්,
53. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ පී. කුගනාදන් මහතා 2013.07.12 දින සිට නැවත නියමයක් කරන තුරු මැතිවරණ දෙපාර්තමේන්තුවේ සහකාර මැතිවරණ කොමසාරිස්වරයකු වශයෙන්,
54. ශ්‍රී.ලං.ප.සේ. III පන්තියේ ආර්. පී. එම්. එස්. රාජපක්ෂ මහත්මිය 2012.09.26 දින සිට නැවත නියමයක් කරන තුරු ජොෂ්ඨ අමාත්‍ය ලේකම් කාර්යාලයේ සහකාර ලේකම් වශයෙන්,
55. ශ්‍රී. ලං. ප. සේ. I පන්තියේ එස්. ඒ. එම්. එල්. ගුණතිලක මහතා 2013.06.26 දින සිට නැවත නියමයක් කරන තුරු රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ අධ්‍යක්ෂ (සංවර්ධන) වශයෙන්,
56. ශ්‍රී. ලං. ප. සේ. විශේෂ ශ්‍රේණියේ එම්. ඒ. බී. ඩී. සෙනරත් මහතා 2013.07.01 දින සිට නැවත නියමයක් කරන තුරු මිනුම්දෝරු දෙපාර්තමේන්තුවේ අතිරේක මැනුම්පති (මානව සම්පත් හා පාලන) වශයෙන්,
57. ශ්‍රී. ලං. ප. සේ. විශේෂ ශ්‍රේණියේ සුමිත්‍රා කන්නන්ගර මහත්මිය 2013.06.20 දින සිට නැවත නියමයක් කරන තුරු විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන්
58. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ටී. ඒ. ගමගේ මහත්මිය 2013.02.06 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන කොමසාරිස් (මානව සම්පත් සංවර්ධන) වශයෙන්,
59. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ බී. ඒ. එන්. දිල්රුක්ෂි මහත්මිය 2013.01.24 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වශයෙන්,
60. ශ්‍රී. ලං. ප. සේ. III පන්තියේ ඒ. ඊ. නිරෝෂා දීපනී මහත්මිය 2013.02.28 දින සිට නැවත නියමයක් කරන තුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වශයෙන්.

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.
2013 අගෝස්තු මස 02 වැනි දින.

08-744

# රජයේ නිවේදන

## සබරගමු මහ සමන් දේවාලීය ඇසළ උත්සවය - 2013

362 අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනත යටතේ පළකර ඇති අංක 1563, 2008.08.15 වන දින ගැසට් පත්‍රය ප්‍රකාරව හා 1992 අංක 58 දරන බලතල පැවරීම (ප්‍රාදේශීය ලේකම්වරුන්) පනත අනුව රත්නපුර ප්‍රාදේශීය ලේකම් චිත්‍රා මානෙල් කෝට්ටවත්ත වන මා වෙත පැවරී ඇති බලතල අනුව, 2013 සබරගමු මහ සමන් දේවාලයේ ඇසළ උත්සව කඳවුර සම්බන්ධයෙන් පහත සඳහන් නියෝග පවරමි :-

01. මෙවර සබරගමු මහ සමන් දේවාලයේ ඇසළ උත්සවය 2013 වර්ෂයේ සැප්තැම්බර් මස 05 වන දින ආරම්භ වී සැප්තැම්බර් මස 21 වන දින දිය කැපීමෙන් පසු අවසන් වන බව දැනුම් දෙමි.

02. උතුරට වැසියන් පදිංචි පරවේනි නිළ කරුවන්ගේ ඉඩම් රථගාල සහ සල්පිල භූමිය පෙන්වන සිමෙන්ති කණුව හා රථගාලට ඇතුළු වන පාරද, දකුණට තෙන්නගෙ වත්ත හා කළු ගඟද, නැගෙනහිරට රත්නපුර-පානදුර ප්‍රධාන මාර්ගය ද, බස්නාහිරට දේවාලය සතු මහ උයන්වත්ත යන සීමාවන්ට මැදිව පිහිටි භූමි භාගය ඇසළ උත්සවය පවත්වන භූමි භාගය වේ. රත්නපුර-පානදුර ප්‍රධාන මාර්ගයේ ප්‍රධාන වාහල්කඩේ සිට කොටාඹේ දක්වා ගමන් කර එතන සිට මාර්ගය ඔස්සේ කළු ගඟ දක්වා හා කළු ගඟ ඔස්සේ රත්මල් ඇල්ල දක්වා ගමන් කර එම ස්ථානයේදී දිය කපා ආපසු එම මාර්ගය ඔස්සේ නැවත මහ සමන් දේවාලය දක්වා පැමිණීම දිය කැපීමේ පෙරහැරේ ගමන් මාර්ගය වේ ;

03. දේවාල භූමිය වැලි මළුව හුණුවන වීදිය හා කුරුවිට, ගම්පහේ වීදියට මැදිව පිහිටි භූමි භාගය හා වීදිය අවට භූමිය තුළ ආහාර පිසීම තහනම් කරමි ;

04. පෙරහැර දින පහ සඳහා සල්පිල් භූමියේ පිහිටි ස්ථිර මල් කඩ හය තාවකාලික වෙළෙඳ සැල් හා සල්පිල් භූමිය තාවකාලික වෙළෙඳසැල් 200 ක් සඳහා මා විසින් වෙන්දේසි කර අවසරය ලබා දෙන බව දන්වමි. මෙම වෙළෙඳසල්හි මල්, හඳුන්කූරු, ඉටිපන්දම්, කපුරු, භාර ඔප්පු කිරීම සඳහා අවශ්‍ය රසකැවිලි හා විසිතුරු භාණ්ඩ විකිණීම සඳහා අවසරය දෙමි ;

05. අංක 04 හි සඳහන් සල්පිල් භූමියෙහි හැර උත්සව භූමිය ඇතුළත අන් කිසිම ස්ථානයක වෙළෙඳාම කිරීම සම්පූර්ණයෙන් තහනම් කරමි ;

06. රථගාල පරිශ්‍රයෙහි හැර උත්සව භූමිය ඇතුළත අන් කිසිදු ස්ථානයක පුද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථවාහන මගින් හෝ කඳවුරු භාර නිළධාරි තැනගේ අවසර පත්‍රයක් නොමැතිව උත්සව භූමියට ඇතුල් කිරීම තහනම් කරමි ;

07. රත්නපුර-පානදුර ප්‍රධාන මාර්ගයට මුහුණලා ඉදි කර ඇති ප්‍රධාන වාහල් කඩ තුළින් දේවාල පූජා භූමියට වාහන ඇතුල් කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි ;

08. මා විසින් කඳවුරු භූමිය තුළ වෙළඳාම් කිරීම සඳහා වෙන් කරනු ලබන බිම් කොටස් වෙන්දේසි කරන ආකාරය දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ ;

09. වෙන්දේසි කරන ලද වෙළෙඳ බිම් වල ඉදි කරනු ලබන තාවකාලික ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල විය යුතු ය. බිම් කොටස් ලබා ගන්නා වෙළෙන්දන් විසින් ඇසළ උත්සවයෙන් පසු තමාගේ තාවකාලික ගොඩනැගිලි ඉවත් කර

ගැනීමෙන් පසු කඳවුරු භූමිය තුළ පොලිතීන් ඇතුළු සියලුම අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතු ය ;

10. මගෙන් ලබා ගත් අවසර පත්‍රයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිම ගොඩනැගිල්ලක් ඉදි කිරීම තහනම් කරමි.

15 වන ව්‍යවස්ථාව

(අ) කිසිවකු විසින් ප්‍රාදේශීය ලේකම් තැනගේ අවසරය ලබාගෙන මිස වීදියක් වශයෙන් පාවිච්චි කරන්නාවූ හෝ වෙන් කරගන්නා වූ හෝ උත්සව භූමිය තුළ වෙන යම් භූමි කොටසක් හෝ ඇසුරු කරගෙන මඩුවක් හෝ යම්කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ විශාල කිරීම නොකළ යුතු ය.

(ආ) ප්‍රාදේශීය ලේකම්ගේ හෝ බලයලත් නිලධාරීන්ගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් උත්සව භූමිය තුළ ටිකට් පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතු ය.

(ඇ) සමන් දේවාල පෙරහැර පවත්වන කාල සීමාව තුළ එම භූමියේ සහ ඒ අවට දේවාල සීමාව තුළ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන විකිණීම සඳහා භාවිතා කිරීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

සී. එම්. කෝට්ටවත්ත,
ප්‍රාදේශීය ලේකම්,
රත්නපුර.

2013 අගෝස්තු මස 05 වැනි දින.

08-778

---

## බදුල්ල කතරගම දේවාලයේ වාර්ෂික පෙරහැර

362 අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනතේ පළකර ඇති 1948 සැප්තැම්බර් 10 දාතම අංක 9902 *ගැසට් පත්‍රයේ* ද, 1951 අගෝස්තු දාතම අංක 10283 ගැසට් පත්‍රයේ ද, 1955 මාර්තු 25 දාතම අංක 14778 *ගැසට් පත්‍රයේ* ද, 1992 අංක 58 බලතල පැවරීම (ප්‍රාදේශීය ලේකම්වරු) පනත අනුව, 2009.10.02 වැනි දින අංක 1622 දරන *ගැසට් පත්‍රයේ* ද පළවූ බදුල්ල කතරගම දේවාලයේ (වාර්ෂික පෙරහැර) පිළිබඳ ව්‍යවස්ථාව අනුව ද බදුල්ල ප්‍රාදේශීය ලේකම් ගාමිණී මහින්දපාල ජෝපියන් වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2013 බදුල්ල කතරගම දේවාලයේ වාර්ෂික පෙරහැර සම්බන්ධයෙන් පහත නියෝග පනවමි.

(1) 2013 සැප්තැම්බර් මස 06 වැනි දින කප් සිටුවීමෙන් බදුල්ල කතරගම දේවාලයේ වාර්ෂික පෙරහැර ආරම්භ වී, 2013 සැප්තැම්බර් මස 06 වැනි දින සිට 11 දින දක්වා (දින 06) අභ්‍යන්තර පෙරහැර, 2013 සැප්තැම්බර් මස 12 සිට 16 දින දක්වා (දින 05) කුඹල් පෙරහැර, 2013 සැප්තැම්බර් මස 17 වැනි දින සිට 21 (දින 05) රන්දෝලි පෙරහැර, 2013 සැප්තැම්බර් මස 22 වැනි දින අළුයම දිය කැපීමේ මංගල්‍යය, 2013 සැප්තැම්බර් මස 22 වැනි දින දහවල් පෙරහැර ගෙවදීමෙන් අවසන් වන බව දැනුම් දෙමි.

(2) *පෙරහැරේ ගමන් මාර්ගය* :

බදුල්ල කතරගම දේවාලයේ සිට බදුල්ල පහළ වීදිය, පස්සර පාර, (මුතියංගණ වට රවුම) ලොන්ඩන් පාර, අනගාරික ධර්මපාල මාවත, කොකෝවත්ත පාර, උදයරාජ මාවත, රජ වීදිය, කඩවීදිය පහළ වීදිය, බදුල්ල කතරගම දේවාලයට ගෙවදීම.

(3) බදුල්ල කතරගම දේවාල භූමිය හා දේවාලයට අයත් සිංහාසනය පිහිටි භූමිය යන ස්ථානයන් හා ඒ අවට භූමි භාගවල ආහාර පිසීම හා වෙළඳාම් කිරීම තහනම් කරමි.

(4) පෙරහැර කාලය තුළ දී ප්‍රධාන මාර්ගවල පෞද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුලුව සියලුම රථ වාහන මගෙන් හෝ දේවාල භාර නිලමේ තුමාගෙන් බලපත්‍රයක් නොමැතිව දේවාල භූමියට ඇතුලු කිරීම තහනම් කරමි.

(5) පෙරහැර ගමන් ගන්නා මාර්ගයන්හි බදුල්ල මහ නගර සභාව මගින් විධිමත් අනුමැතියකින් ඉදි කරනු ලබන ගොඩනැගිලි හා දැනට ඇති ස්ථිර ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල විය යුතු ය. බිම් කොටස් බදු ගන්නා වෙළඳුන් විසින් දේවාල පෙරහැරින් පසු තමාගේ තාවකාලික ගොඩනැගිලි ඉවත් කර ගැනීමෙන් පසු පෙරහැර ගමන් ගන්නා මාර්ගය හා දේවාල භූමිය තුළ පොලිතීන් ඇතුළු සියලුම අප ද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ගේ උපදෙස් පරිදි ඉවත් කල යුතු ය.

(6) මාගෙන් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව පූජා භූමිය හා එහි අවට කිසිම තාවකාලික හෝ ගොඩනැගිල්ලක් ඉදි කිරීම තහනම් කරමි.

(7) කිසිවකු විසින් මාගේ හෝ බදුල්ල මහ නගර සභාව මගින් අවසර ලබාගෙන මිස වීදියක් වශයෙන් පාවිච්චි කරන්නා වූ හෝ වෙන් කර තබන්නා වූ හෝ යම් බිමක් හෝ පූජා භූමි ප්‍රදේශයක් තුළ යම් බිමක් ඇසුරු කරගෙන මඩුවක් හෝ යම්කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ විශාල කිරීම නොකළ යුතු ය.

(8) රතිඤ්ඤා වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම්ය.

(9) ප්‍රාදේශීය ලේකම්ගේ බලයලත් නිලධාරියෙකුගෙන් අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තකු විසින් අංක 03 හි දැක්වෙන කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයන් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතු ය.

ගාමිණී මහින්දපාල ජෝපියස්,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2013 අගෝස්තු මස 01 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-679

**1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත**

අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටත් පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1) 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ටී. කේ. රත්නසූරිය,<br>
ලේකම් (වැ. බ.),<br>
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2013 අගෝස්තු මස 05 වැනි දින.<br>
අංක 80,<br>
අධිකරණ මාවත,<br>
කොළඹ 12,

**උපලේඛනය**

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමියන්ගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| 01<br>42387 | දිනයාදුර ලසිත චින්තක මයා,<br>අංක 33,<br>"සත්සර",<br>මූකලන්ගමුව,<br>සීදුව. | කරන්නාගොඩ අචලා දීපානි තනුජා පෙරේරා මිය,<br>අංක 79/ආර්, 2 බී,<br>නිවාස ක්‍රමය,<br>රද්දොළුගම. |
| 02<br>42445 | රණසිංහ ආරච්චිගේ සන්ධ්‍යා ධම්මිකා මිය<br>අංක 304/12,<br>දික්වල පාර,<br>සියඹලාපෙ. | වීරසිංහ මුදියන්සේලාගේ යසවතී මිය,<br>අංක 364/2බී,<br>දිබ්බැද්ද වත්ත,<br>ඔලබොඩුව,<br>ගෝනපොල. |
| 03<br>42570 | බාදන මුදියන්සේලාගේ නන්දසේන මයා,<br>අස්සැද්දුම,<br>ගවරම්මාන,<br>කැප්පෙටිපොල | දිවිතොටවෙල කෝනාර මුදියන්සේලාගේ සමරනායක මයා,<br>සුචරිතගම හන්දිය,<br>"සුරම්‍ය නිවස"<br>නුගතලාව. |
| 04<br>42645 | 1. කහංගම දේවගේ ප්‍රබුද්ධ කහංගම මයා<br>අංක 292/6,<br>පැලන්වත්ත,<br>පන්නිපිටිය.<br><br>2. කුඩාහින්ද දේවගේ සුමිත්‍රා මිය,<br>අංක 292/6,<br>පැලන්වත්ත,<br>පන්නිපිටිය. | සීහෝම්ස් ක්‍රෙඩිට් ඇන්ඩ් ඉන්වෙස්මන්ට් ලිමිටඩ්<br>අංක 101,<br>ගාලුපාර,<br>කොළඹ 03. |
| 05<br>42661 | ගෝනාපීනුවල දෙවිනිස් මයා,<br>"සිරිවිලා",<br>ගනේගොඩ,<br>රත්ගම. | යද්දෙහි රම්‍යලතා මිය,<br>මහගෙදර වත්ත,<br>ඉඹුලගොඩ,<br>රත්ගම. |

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමියන්ගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| 06<br>42683 | බමුණුසිංහ විතාන ආරච්චිලාගේ දීපා රංජනී මිය,<br>අංක 166/6 ඒ,<br>පහල බියන්විල,<br>කඩවත. | සූරිගේ සීලවතී මිය,<br>අංක 391/240,<br>වලව්වත්ත, වැලිපිල්ලෑව,<br>ගණේමුල්ල. |
| 07<br>42730 | ඉලන්දාරිදේව සුනේත්‍රා කුමාරි මිය,<br>46/2,<br>ගමගේ වත්ත,<br>දංගෙදර,<br>ගාල්ල. | ඉලන්දාරිදේව ජානක කුමාර මයා<br>551ඩී,<br>කීනගහතොට,<br>කරන්දෙනිය, |
| 08<br>42752 | ගොවින්නගේ සමන්ත කුමාර රත්නායක මයා,<br>දකුණු/පන්නරේ,<br>වැලිපැන්නගහමුල. | රත්නායක මුදියන්සේලාගේ දූෂාන්ත රේණුක මයා,<br>දකුණු/පන්නරේ,<br>වැලිපැන්නගහමුල. |
| 09<br>42755 | හේමකීර්ති බණ්ඩාර ඒකනායක මයා,<br>ගුරුනිවස,<br>කඩුවෙල විදුහල,<br>උකුවෙල. | පහල යමානයැලෑ ගෙදර අබේරත්න මයා,<br>අංක 25,<br>තාලිංගාමඩ,<br>ඇල්කඩුව. |

08-673

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - අම්බලන්ගොඩ**
**2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0240- 06252750-001

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.07.15 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක : පිකිච් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ගාමිණී ඩේවිඩ් විසින් සහතික කරන ලද 2005 සැප්තැම්බර් 14 දිනැති අංක 2736 සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. පී. පලිහපිටිය විසින් සහතික කරන ලද 2008 අගෝස්තු 29 දිනැති අංක 311 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, අම්බලන්ගොඩ පදිංචි කෝට්ටේ හේවා විමල්තිලක යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එක් කෝටි දෙලක්ෂ තිස්හත්දාස් හත්සිය අනූපහයි ශත විසිහයක (රු.10,237,795.26) මුදලක් 2012 නොවැම්බර් මස 19 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුව වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 10,237,795.26 මුදල ද, 2012 නොවැම්බර් 20 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් එක (31%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර ඉහත කී අංක 2736 සහ 311 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### *උපලේඛනය*

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වෙල්ලබොඩ පත්තුවේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුල මීටියාගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. එම්. සිරිපාල විසින් සාදන ලද 1992.07.05 දිනැති අංක 227 දරන සැලැස්මේ නිරූපනය වන මීටියාගොඩ කුරුඳුවත්ත නමැති බිම, ගස්, නිවස සහ කර්මාන්ත ශාලාව සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් ඒ ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : නිවෙස්වල සිට ප්‍රධාන පාරට යන පාර ද, නැගෙනහිරට : ලොට් සී (පන්සල් පරිශ්‍රය) ද, දකුණට : මෙම ඉඩමේ ලොට් අංක 5 සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් අංක 2 යන මායිම් තුල පෙර කී අංක 227 දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් විස්සයි දශම තුනයි නවයක් (අ. 0, රූ. 1 පර්. 20.39) ක් නොහොත් හෙක්ටයාර් 0.153 ක් විශාල ඉඩම.

මෙය ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් සී. 773/253, 285 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැව් මිය,
සහකාර සාමාන්‍යාධිකාරිනී - නීති

08-772/2

---

### සෙලාන් බැංකුව පීඑල්සී - ප්‍රයිවෙට් බැංකින් (මිලේනියම් ශාඛාව 2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවූ 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.05.29 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 09957 - 00330925 - 001
(0860 041852-001)

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත.) ප්‍රසිද්ධ නොතාරිස් ටී. එච්. ඩී. එල්. එල්. ජයසේකර විසින් සහතික කරන ලද 2007 නොවැම්බර් 2 දිනැති අංක 1395 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, (01) කොළඹ 03 හි සුනේත්‍රා සරසලී ෆරැන්සිස්කා ෆොන්සේකා (02) කොළඹ 03 හි ජෝෂප් ලියොන් දේශප්‍රිය පොන්සේකා (03) කොළඹ 03 හි ඇන්ටන් ජයලත් ශ්‍රීනාත් ෆොන්සේකා (04) කොළඹ 03 හි දැන් ඇමෙරිකා එක්සත් රාජධානියෙහි සෙම්බුගේ දෝන ජානකි ශ්‍රීමති නිර්මලී පොන්සේකා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක් කෝටි අටලක්ෂ අසූ හතර දහස් එකසිය විසිතුනයි ශත විසිහතරක (රු. 10,884,123.24) මුදලක්, 2012 අගෝස්තු මස 3 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 10,884,123.24 මුදල ද, 2012 අගෝස්තු 4 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් එක (31%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්), එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 1395 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ මහ නගර සභා සීමාව තුල බම්බලපිටිය වෝඩ් තුල ඩින්ස්ටන් පෙදෙසෙහි පිහිටි බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. පර්ඩිනැන්ඩ්ස් විසින් සාදන ලද 1973 ඔක්තෝබර් 23 දිනැති අංක 1575 සැලැස්මේ සඳහන් වරිපනම් අංක 6 දරන ලොට් 2 ලකුණු කල ඉඩම් කොටසට මායිම්, උතුරට : ඩින්ස්ටන් පෙදෙස ද, නැගෙනහිරට : ඩින්ස්ටන් පෙදෙසෙහි වරිපනම් අංක : 8 දරන පරිශ්‍රය ද, දකුණට : කොල්ලුපිටිය පාර වරිපනම් අංක : 8 දරන පරිශ්‍රය (මෙසේ ෂෝ වොලස් ලී හෙජස් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්) සහ බස්නාහිරට : ලොට් 1 ද යන මායිම් තුල එකී අංක 1575 දරන සැලැස්ම අනුව පර්චස් එකොළහක් (අ. 0, රූ. 0, පර්. 11.00) විශාල ඉඩම, මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඒ/543/202 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඒ. පරණගම මිය,
ප්‍රධාන කළමනාකාරිනී - නීති

08-772/3

---

### සෙලාන් බැංකුව පීඑල්සී - ග්‍රෑන්ඩ්පාස් ශාඛාව 2007 අංක : 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවූ 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0220-02621011-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013. 06.05 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඔමේගා සේනානායක විසින් සහතික කරන ලද 2010 සැප්තැම්බර් 13 දිනැති අංක 419 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 15 සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි සහ ලියාපදිංචි අංක පීවී 61833 දරන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් වන රොඩමස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ කොළඹ 15, කිටිනසාමි ඥාණසේකරන් යන අය බන්ධනදායීන් වශයෙන් රුපියල් එක්කෝටි තිස්හතරලක්ෂ හයදහස් හාරසීය හයයි ශත විසිනවයක (රු. 13,406,406.29) මුදලක්, 2013 අප්‍රේල් 10 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 13,406,406.29 මුදල ද, 2013 අප්‍රේල් 11 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් එක (31%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුන වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 419 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට,

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහනගර සභාව තුල මෝදර වෝඩ් අංක 2 පිහිටි දැන් අලුත් මාවත්ත පාර වරිපනම් අංක : 688 (කලින් අංක 690/2) දරන කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. එෆ්. ගුණසේකර විසින් සාදන ලද 1935.05.18 දිනැති අංක 1105 සැලැස්මේ ලොට් බී සහ දෙල්ගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. සන්ද්‍රසේගර විසින් සාදන ලද 1976.07.20 දිනැති අංක 68 සැලැස්මේ ලොට් 1 හි නැවත මැනීමක් සහ එකතුවක් වන බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් සාදන ලද 1993.03.08 දිනැති අංක 141/1993 සැලැස්මේ නිරූපනය වන ලොට් එක්ස් ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් ඊසානට : මොහමඩ් හුසේන්ගේ අලුතුමාවත්ත පාර, වරිපනම් අංක 690/1 දරන පරිශ්‍රය ද, ගිණිකොණට : මොහොමඩ් හුසේන්ගේ අලුතුමාවත්ත පාර, වරිපනම් අංක 690/1 දරන පරිශ්‍රය සහ ඇලෙක්සැන්ඩර් ඇන්තනීගේ අලුතුමාවත්ත පාර, වරිපනම් අංක 702/39 දරන පරිශ්‍රය ද, නිරිතට : පිළිවෙලින් පී. ඒ. සරත් ප්‍රනාන්දු සහ දාමිකා වීරසිංහගේ අලුතුමාවත්ත පාර, වරිපනම් අංක 686 සහ 680 දරන පරිශ්‍රයන් සහ වයඹට : අලුතුමාවත්ත පාර සහ පී. ඒ. සරත් ප්‍රනාන්දුගේ අලුතුමාවත්ත පාර වරිපනම් අංක 686 දරන පරිශ්‍රය ද යන මායිම් තුල පර්චස් අටයි දශම අටයි නවයයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 8.892) ක් විහාල ඉඩම මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඒ 1154/152 ලියා පදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඒ. පරණගම මිය,
ප්‍රධාන කළමනාකාරිණි - නීති.

08-772/1

---

### මහජන බැංකුව - බොරැල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.01.24 දින පවත්වන ලද රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩී. ජී. ජයසූරිය මහත්මිය විසින් සහතික කරන ලද 2010.05.31 දින අංක 1195 දරන උකස් බැඳුම්කරය ප්‍රකාරව අයවිය යුතු මුදල් ගෙවීම ලලිත් කුමාර දුල්ලෑව මහතා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 1195 දරන උකස් බැඳුම්කරය මත දැනට මහජන බැංකුව වෙත රු. 2,730,805.41 (රුපියල් මිලියන දෙකයි හත්ලක්ෂ තිස්දහස් අටසියපහයි ශත හතලිස් එකක්) වූ මුදලක් මහජන බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

එකී රු. 2,730,805.41 (රුපියල් මිලියන දෙකයි හත්ලක්ෂ තිස්දහස් අටසිය පහයි ශත හතලිස් එකක්) වූ මුදල සහ එකී රු. 2,730,805.41 ක් වූ මුදල මත 2012.01.01 දින සිට වෙන්දේසි දිනය තෙක් වර්ෂයට 16% ක් වූ තවදුරටත් වූ පොලිය සහ වෙනත් විකුණුම් පිරිවැය සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් එම ගෙවීම අඩුකිරීමෙන් පසුව එකී මුදල් අයකර ගැනීම සඳහා අංක 1195 දරන එකී උකස් බැඳුම්කරය මගින් ඉහත කී බැංකුව වෙත උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර අර්වින් පෙරේරා මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර මහනගර සභා සීමාව තුළ (ගම් සභා හංදිය අසල) ගංගොඩවිල පිහිටා ඇත්තාවූද දැනට පැපිලියාන පාරේ වරිපනම් අංක 7 සහ 7 1/2 දරන වරිපනම් අංක 5 සහ 7 දරන ඒ මත වූ ගොඩනැගිල්ල සමග බලයලත් මිනින්දෝරු එස්. ධර්මවර්ධන මහතා විසින් සාදන ලද 1982 ඔක්තෝබර් මස 06 වැනි දින අංක 1330 දරන මිනින්දෝරු සැලැසුමේ නිශ්චිතව දක්වා ගනේලන්ද යනුවෙන් හඳුන්වනු ලබන උතුරට : පැපිලියාන පාරේ වරිපනම් අංක 3 දරන එම ඉඩමේම කොටසක් ද, නැගෙනහිරට : ලොට් C ද, දකුණට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇති පැපිලියාන පාර වරිපනම් අංක 9 දරන එම ඉඩමේම කොටසක් ද, බටහිරට : පැපිලියාන පාර ද යන මායිම් තුළ පිහිටි දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ M3308/105 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි වී ඇති එකී අංක 1330 දරන එකී සැලසුමට අනුව ප්‍රමාණයෙන් පර්චස් පහක් වූ (අ. 0, රූ. 0, පර්. 5) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

කලාප කළමණාකරු,
(කොළඹ දකුණ).

මහජන බැංකු කලාප ප්‍රධාන කාර්යාලය,
(බස්නාහිර කලාපය I),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

08-786

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.